# සිංහලයෝ හා වැද්දෝ

මෙරට ආදී වාසීන් වැද්දන් වේය යන්න දැන් කලක සිට පැතිරවීමට උත්සාහ කෙරෙන මතයක් වෙයි. මේ මතය ප්‍රචාරය කිරීමට හා තහවුරු කිරීමට වෙහෙස ගන්නෝ බොහෝ විට ඊනියා රාජ්‍ය නොවන සංවිධාන මගින් නඩත්තු කෙරෙන උගත්තු වෙති. මේ සංවිධානවලට ඊනියා රාජ්‍ය නොවන සංවිධාන යැයි කියනු ලබන්නේ ඒවා රාජ්‍ය නොවන යැයි කීවද බටහිර රටවල රාජ්‍ය (හා ඇතැම් විට දේශපාලන පක්ෂ) විසින් නඩත්තු කෙරෙන බැවිනි. මේ උගත්තු රට රටවල ආදි වාසීන්ගේ යැයි කියැවෙන මුළු සංවිධානය කරති. මේ සමුළුවට මෙරට වැදි ජනයාට ද ආරාධනා කෙරෙයි.

මේ ආදී වාසී කතාවේ තේරුම කුමක් ද? වැද්දන් ආදි වාසී වූ කළ සිංහලයෝ ආදීවාසී නොවෙති. එවිට සිංහලයන් මෙරටට පිටරටක සිට පැමිණි බවත්. ඒ සම්බන්ධයෙන් ගත් කළ ඔවුන් හා දෙමළ ජනයා අතර යම් සමානත්වයක් ඇති බවත් කිමට හැකිය. දෙමළ ජනයා මෙන්ම සිංහලයන්ද මෙරටට ආගන්තුක බව කීම මෙහි අරමුණ වෙයි. සිංහලයන් එසේ ආගන්තුක යැයි කී විට සිංහලත්වයට මෙරට හිමි තැන අහිමි කිරීමක්ද සිදු වෙයි මෙරට දෙමළ ජනයා පැමිණ ඇත්තේ ඉන්දියාවේ දකුණු ප්‍රදේශයෙන් බව අද නොපිළිගන්නෙක් නැත. එහෙත් සිංහලයන්ද එලෙසම ඉන්දියාවෙන් පැමිණි පිරිසක් යැයි කිව හැකිද?

අපි පළමුවෙන්ම ආදි වාසියා යන්න විග්‍රහ කර බලමු. ආදි වාසියා යන්න ඉබේට ලෝක දේශපාලන සංවාදයට එකතු වූ වචනයක් නොවේ. ඒ වචනය එකතු වුයේ බ්‍රිතානීන් ඔස්සේ ය. බ්‍රිතානීන් ලෝකයේ ඇතැම් රටවල් යටත් කෙළේ ඒ රටවල සිටි ජනයා මුළුමනින්ම මෙන් සමූලඝාතනය කරමින්ය. එසේ කිරීමෙන් පසුව බ්‍රිතානීහු ඒ රටවල නව ජාති හා රාජ්‍ය ඇති කළහ. එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය ආදී රටවල් ඒ සඳහා උදාහරණ වේ. මුළුමනින්ම මෙන් සමූලඝාතනය කළ ද ඒ රටවල බ්‍රිතානීන් යන විට සිටි අයගෙන් යම් පිරිසක් ඉතිරි වූහ. අද ඒ රටවල ආදී වාසීන් ලෙස හැඳින්වෙන්නෝ මේ ඉතිරි වූ පිරිසෙන් පැවතෙන්නෝ වෙති. ඒ රටවල ආදීවාසීන්ට අද ඉඩම නැත. පෞද්ගලික අයිතිය පිළිබඳ සංකල්පය නොමැති වුවද බ්‍රිතානීන් ඒ රටවලට යන විට ඉඩම් සාමූහිකව අයිති වී තිබුණේ ආදිවාසීන් ලෙස හැඳින්වෙන්නවුන්ටය. අද ඒ සාමූහික අයිතියද ඔවුන්ට නැත.

ලංකාවේ තත්ත්වය කුමක්ද? සිංහලයෝ මෙරටට භාරතයෙන් (ඉන්දියාවෙන්) සංක්‍රමනය වී මෙරට එවකට විසූ ජනතාව මුළුමනින්ම මෙන් ඝාතනය කළෝ ද? නැත්නම් සිංහල ජාතිය ද මෙරටම නිර්මාණය වූ (නිෂ්පන්න) ජාතියක්ද? මෙරට ආදිවාසීහු වැද්දෝද? වර්ගීකරනය අනන්‍යතාව ආදිය ගැන මෙලෝ හසරක දැනුමක් නැති ඇතැම් පණ්ඩිතයෝ සිංහලයන්ට හිමි තැන අහිමි කිරීම සඳහා සිංහලයන් මෙරටට භාරතයෙන් පැමිණි බවද වැදි ජනතාව මෙරට ආදිවාසීන් බවද පවසති. සිංහලයන් මෙරටට පැමිණියේ භාරතයෙන් නම් සිංහලයන් අද කෙසේ වෙතත් විජය රජු දවස එහි සිටිය යුතුය. දෙමළ ජනයා මෙරටට පැමිණියේ දකුණු ඉන්දියාවෙනි. ඒ පිළිබඳ විවාදයක් නැත. අදද දෙමළ ජනයා දකුණු ඉන්දියාවේ වෙසෙති. බ්‍රිතානීන් ඕස්ට්‍රේලියාව ආදී රටවලට ගියේ බ්‍රිතානියෙනි. ඕස්ට්‍රේලියාව ආදී රටවලට ගෙනගියේ බ්‍රිතානියේ තිබූ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය. බ්‍රිතානීහු ඒ රටවලට ගොස් එහි ජීවත් වූ වැසියන්ගෙන් වැදගත් යමක් තම සංස්කෘතිය තුළට අවශෝෂණය කර නොගත්හ. එහෙත් ලංකාවේ සිදු වුයේ කුමක්ද? ආර්ය භාෂා කතා කළවුන් ක්‍රිස්තු වර්ෂයෙන් පෙර නවවැනි සියවසේ දී පමණ මෙරටට පැමිණි බැව් ආචාර්ය ශිරාන් දැරණියගල මහතා අවුරුදු විස්සකට පමණ පෙර අනුරාධපුරයේ කළ කැණීම්වලින් අනාවරණය කර ඇත. ආර්ය භාෂා කතා කළවුන් ලංකාවට පැමිණෙන විට මෙරට විසූවෝ හෙළයෝය යක්ෂ, නාග, දේව ආදී ගෝත්‍රවලට අයත් හෙළයෝ එකම භාෂාවක් කතා කළ බව අපවත්වී වදාළ පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමියන් පෙන්වා දී ඇත.

ආර්යයන් (ඒ භාෂා කතා කළවුන් යන තේරුමින්) ලංකාවට පැමිණ ඇත්තේ උතුරු ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් බව අපේ වංශ කතාවල සඳහන් විජය ප්‍රවෘත්තියෙන් හෙළිවෙයි. විජය කතාව හෙවත් විජය ප්‍රවාදය වැදගත් එකකි. විජය කතාව වැදගත් වන්නේ සිංහලයන්, එනම් සිංහල ජාතිකයන් යනු කවුරුන්දැයි යන ප්‍රශ්නය ඉන් ඇසෙන බැවිනි.

© Prof. Nalin De Silva

විජය කතාවේ වැදගත්කම ඇත්තේ පිළිතුරෙහි නොව ප්‍රශ්නයෙහි ය. සිංහලයන් යනු කවුරුන්ද යන ප්‍රශ්නය දීපවංශය රචිත ක්‍රිස්තු පූර්ව හතරවැනි සියවසේ නැඟීමට නම් එකලද සිංහල නමින් ජාතියක් (අඩුම තරමින් ජන වර්ගයක්) පැවතිය යුතුය. නොපවතින ජාතියක සම්භවය පිළිබඳ ප්‍රශ්න කරන්නෙක් නැත. ඇතැම් කසිකබල් ඉතිහාසඥයන් සිංහල ජාතියේ සම්භවය ක්‍රිස්තු වර්ෂය දහවැනි එකළොස්වැනි සියවස්වලට ගෙන ඒමට උත්සාහ දරන්නේ සිංහලයේ සම්භවය පිළිබඳ ප්‍රශ්නය ඉන් අවුරුදු එක්දහස් පන්සියයකට පෙර සිංහලයන් නගා ඇති පසුබිමකය.

ප්‍රශ්නය එසේ නගා තිබුණද එයට දුන් පිළිතුරු උතුරු ඉන්දියාවට පක්ෂපාතී වූවක් විය. විජය හා හත්සියයකගෙන් සිංහල ජාතිය පැවතෙන්නේය යන පිළිතුර අපේ වංශකතාවල සඳහන් වන්නේ මේ පක්ෂග්‍රාහී ප්‍රතිපත්තිය හේතුකොටගෙන ය. මේ පිළිතුර නිර්මාණය කරන්නට ඇත්තේ ආර්ය රජවරුන් සමග මෙරටට පැමිණෙන්නට ඇති බ්‍රාහ්මණයන් යැයි සිතිය හැකිය. පණ්ඩුකාභය රජු දවස ද මේ බ්‍රාහ්මණයන් දැරූ වැදගත් තත්ත්වය පණ්ඩුල බ්‍රාහ්මණයාගේ කතාවෙන් හෙළි වෙයි. මේ බමුණෝ (සිංහල යන සිංහල බෞද්ධ වන තෙක් ආර්ය රජුන්ට උපදෙස් දෙන්නට ඇත්තේ පුරෝහිත බමුණන් විය යුතුය. සිංහලයන් බෞද්ධ වීමෙන් පසුව මෙරටට අධ්‍යාපනය බමුණන්ගෙන් භික්ෂූන් වහන්සේ ලබා ගත්තේ යැයි බද්දේගම විමලවංශ හිමියන් සඳහන් කර ඇත.) ඉන්දියාවට පක්ෂපාතිව වැඩ කළහ. සිංහලයන් බෞද්ධ වීමෙන් පසුවද මේ බ්‍රාහ්මණ බලපෑම තිබූ බව පැරැණි සිංහල පොතපතින් හෙළිවෙයි. උමංදාව රචනය කළ අවධියේ පවා බ්‍රාහ්මණ බලපෑම තිබී ඇත. වීදාගම මෛත්‍රිය හිමියන්, වැත්තෑවේ හිමියන් ආදී භික්ෂූන් වහන්සේ මේ බ්‍රාහ්මණ බලයට විරුද්ධව කටයුතු කර ඇති අන්දම අපට මෙහි දී අමතක කළ නොහැකිය. කෙසේ හෝ විජය කතාවෙන් අප ගත යුත්තේ ප්‍රශ්නය මිස පිළිතුර නොවේ.

විජය ප්‍රවාදයෙන් හෙළිවන කරුණක් නම් ආර්යයන් උතුරු ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයකින් මෙරටට පැමිණ ඇති බවය. විජය කුමරු රැගත් නැව ඉන්දියාවේ නැගෙනහිර වෙරළින් ගමන පටන්ගෙන ඉන්පසු බටහිර වෙරළට ගොස් පසුව ලංකාවට පැමිණි බැව් වංශකතා කියයි. ආර්යයන් උතුරු ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණීම වංශකතාකරු එක කතාවක් බවට පත්කර ඇති බව පෙනී යයි. විජයගේ නැව උතුරු ඉන්දියාවේ විවිධ වරායවලට යවන්නේ ඒ ඒ ප්‍රදේශවලින් ලංකාවට ආර්යයන් පැමිණීම සිහි ගැන්වීමට යැයි සිතෙයි. කෙසේ හෝ ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණි ආර්යයන් එවකට ලංකාවේ විසූ හෙළයන් සමග පසුව මිශ්‍රවන්නට ඇත. එහිදි දෙපිරිස අතර යුද්ධ නොතිබුණා නොවේ. මේ යුද්ධවලින් තීරණාත්මක ජයග්‍රහණයක් ලැබූ තැනැත්තා විජය විය හැකිය. විජය යනු දෙමව්පියන් ඒ රජුට දුන් නාමයකට වඩා බමුණන් දුන් නාමයක් විය හැකිය. විජය රජුට ඉන්දියාවෙන් මනාලියක් ගෙන්වාගැනීමටද මේ පෙරෙවි බමුණන් මැදිහත් වන්නට ඇත. එහෙත් මෙරට තීරණාත්මක සාධකය වූයේ බමුණන් නොවේ. ආර්යයෝ මෙරට විසූ හෙළයන් සමග යුද්ධ කරන අතරම ඔවුන් සමග මිශ්‍ර වීමටද කටයුතු කළහ.

ආර්ය හා හෙළ මිශ්‍රණයෙන් සිංහල ජාතිය ඇති වුණු බව පැහැදිලිය. සිංහල ජාතියේ මෙන් සිංහල භාෂාවෙහි ද මිශ්‍ර තත්ත්වය දැකගත හැකිය. අප අතර තවමත් හෙළ වදන් යොදා ගැනෙන බව මහාචාර්ය හෙට්ටිආරච්චි මහතාගේ අධ්‍යයනයන්ගෙන් හෙළි වෙයි. කට, බඩ, බෙල්ල, බඩ, කකුල ආදිය හෙළ වදන් වෙයි. ආර්යයන්ගේ හා හෙළයන්ගේ මිශ්‍රණයෙන් පන්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ආරම්භ වූ බව පිළිගත හැකිය. මෙයින් පෙනී යන කරුණ නම් සිංහලයන් භාරතයෙන් හෝ වෙනත් ප්‍රදේශයකින් හෝ මෙරටට නොපැමිණි බවය. ආර්යයන් මෙරටට භාරතයෙන් පැමිණි බව සැබෑය. එහෙත් සිංහලයෝ යනු හුදු ආර්යයෝ නොවෙති. ලංකාවට පැමිණි ආර්යයෝ හෙළයන් සමූලඝාතනය නොකළහ. ඔවුහු හෙළයන් සමග මිශ්‍ර වූහ. මෙයින් ආර්ය භාෂා හා හෙළ බස මිශ්‍ර වූ සිංහල භාෂාවක් ආර්ය සංස්කෘතියෙහි හා හෙළ සංස්කෘතියෙහි මිශ්‍රණයෙන් ඇති වූ සිංහල සංස්කෘතියක් හා ආර්යයන්ගේ හා හෙළයන්ගේ මිශ්‍රණයෙන් බිහි වූ සිංහල ජාතියක් ඇති විය. සිංහල ජාතිය මෙන්ම සිංහල භාෂාව හා සිංහල සංස්කෘතියද මෙරට නිපන් ත්‍රිත්වයක් විය.

මෙහිදී එක් වැදගත් කරුණක් සඳහන් කළයුතුය. හෙළයෝ ආර්යයෝ හෝ ද්‍රවිඩයෝ නොවූහ. ආර්යයන් මෙන් ම ද්‍රවිඩයෝ ද භාරතයට පැමිණියේ බටහිර දෙසින්ය. ද්‍රවිඩයන් දකුණු ඉන්දියාවට පැමිණ ඇත්තේ ආර්යයන්ට ද පසුවය. ආර්යයන් හා ද්‍රවිඩයන් භාරතයට පැමිණීමට පෙර භාරතයෙහි ද ලංකාවෙහි ද විසූවෝ ආර්යයෝවත් ද්‍රවිඩයෝවත් නොවූහ. ආර්යයන් භාරතයට පැමිණීමට පෙර භාරතයේත් ලංකාවේත් වාසය කළේ ද්‍රවිඩයන් යැයි ඇතැමුන් කියන්නේ කරුණු හරිහැටි වටහා ගැනීමෙන් නොවේ.

© Prof. Nalin De Silva

වැද්දන් යනු කවුද යන ප්‍රශ්නයට ද කෙටියෙන් පිළිතුරක් දිය යුතුය. මෙරට යක්ෂ, නාග, දේව ආදී ගෝත්‍රවලට අමතරව වැදි ජනතාව ද වාසය කර ඇති බව වංශකතාවලින් පැහැදිලි වෙයි. වැදි ගෝත්‍රය බොහෝ කාලයක් තිස්සේ මෙරට ජීවත් වී ඇත. ඔවුන් හා යක්ෂ ආදී හෙළයන් අතර වෙනසක් වෙයි. හෙළයෝ යම් ආකාරයක කෘෂිකාර්මික, නාවික ජීවන ක්‍රමයක් ගොඩනගා නොතිබුණි. එහෙත් වැදි ජනතාව කිනම් හේතුවක් නිසා හෝ ඒ සංස්කෘතීන් ප්‍රතික්ෂේප කර ඇති බව පැහැදිලිය. එබැවින් ඔවුහු දඩයම්කරුවන් හා පළ වැල නෙලන්නන් ලෙසම ජීවත් වූහ. හෙළයන්ට වඩා වැද්දන්ගේ ආදි වාසී භාවයක් නැත. ඒ සියල්ලෝම මෙරට වැසියෝ වූහ. හෙළයෝ වැද්දන් ශිෂ්ට කිරීමට නොගියහ. එසේ අනෙක් මිනිසුන් ශිෂ්ට කරන්නෝ යුරෝපීයෝය. ඒ යුරෝපීයයන්ගේ අශිෂ්ටකම නිසා සිදුවන්නකි. හෙළයන් පමණක් නොව හෙළයන්ගේ හා ආර්යයන්ගේ මිශ්‍රණයෙන් බිහි වූ සිංහලයෝද වැද්දන් ශිෂ්ට කිරීමට උත්සාහ නොගත්හ. එබැවින් මෑතක දී බටහිර නූතනත්වයේ අනිටු පළ පැතිර යන තෙක් ම වැද්දෝ තම සංස්කෘතිය රැක ගනිමින් ජීවත් වූහ.

වැද්දන් මෙරට ආදිවාසීන් යැයි කියන්නෝ බටහිරයන් විශේෂයෙන්ම බ්‍රිතානීන් දෙස බලා ඉතිහාසය ලියන්නෝ වෙති. වැද්දන් ආදිවාසීන් කිරීමට තැත් කරන්නේ වැද්දන්ට ඇති ආදරයක් නිසා නොව සිංහලත්වයට හිමි තැන අහිමි කිරීමටය. බටහිර උගතුන්ගෙන් ඔවුන්ගේ හෙංචයියන්ලාගේත් දැන ගැනීම පිණිස කිව යුත්තේ වැද්දන් ස්වෙච්ඡාවෙන්ම දඩයම් කරුවන් හා පල වැල නෙලන්නන් ලෙස ජීවත්වීමට තීරණය කර ඇති බවත් බටහිරයන් මෙන් නොව ශිෂ්ටයන් වූ සිංහලයන් ද ඊට පෙර හෙළයන්ද, වැද්දන්ගේ ඒ තීරණයට ගරු කර ඇති බවත්ය. වැද්දන් තම දඩයක්කාර සංස්කෘතිය රැකගත් පමණින් ඔවුන් ආදී වාසීන් ලෙස නොසැලකිය යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva